# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

| බුද්ධ ධර්මය I/II | 6 ශ්‍රේණිය | කාලය : පැය 02 යි |
|---|---|---|

ශිෂ්‍යයාගේ නම :- ........................................................................................................................................

## I පත්‍රය

සැ.යු.

- ප්‍රශ්න අංක 01 සිට 20 දක්වා සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මුලු ලකුණු 40 කි.
- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1) පස්මහ බැලුම් ඇතුළත් පිළිතුර තෝරන්න.

i. ඇස, කන, නාසය, දිව, ශරීරය  iii. රූප, වේදනා, සංඥා, සංඛාර, විඥ්ඥාණ

ii. කාලය, දීපය, දේශය, කුලය, මව  iv. රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ

2) **"රජතුමනි මේ කුමරු ඒකාන්තයෙන් ම බුදු වෙනවා, එබැවින් මම සිනාසුණෙමි. කුමරු බුදුවන්නට පෙර මා මිය යන බැවින් හැඬුවෙමි"** මෙම ප්‍රකාශය සිදු කරන ලද්දේ කවුරුන් විසින් ද?

i. සුදොවුන් රජු විසිනි.  iii. අසිත තාපසතුමා විසිනි.

ii. කිසා ගෝතමිය විසිනි.  iv. පස්වග තවුසන් විසිනි.

3) සිදුහත් කුමරු අභිනිෂ්ක්‍රමණය කළේ කුමන පොහොය දිනක ද?

i. වෙසක් පොහොය දිනක ය.  iii. පොසොන් පොහොය දිනක ය.

ii. ඇසළ පොහොය දිනක ය.  iv. උඳුවප් පොහොය දිනක ය.

4) බුද්ධරත්නය වන්දනා කරන ගාථාව වන්නේ,

i. ඉතිපිසෝ භගවා අරහං...යන ගාථාවයි.

ii. සුපටිපන්නෝ භගවතෝ...යන ගාථාවයි.

iii. ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ... යන ගාථාවයි.

iv. වන්දාමි චේතියං සබ්බං... යන ගාථාවයි.

5) පුද්ගලයෙකුගේ මනස සංවර කර ගැනීමට මෙත් වැඩීම මහත්සේ ඉවහල් වේ. මෙත් වැඩීමෙන් ලැබෙන අනුසස් ප්‍රමාණය කොපමණ ද?

i. අනුසස් 9කි.  ii. අනුසස් 10කි.  iii. අනුසස් 11කි.  iv. අනුසස් 14කි.



LIVEWORKSHEETS

- **අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල හිස්තැනට අදාළ පිළිතුර තෝරා ලියන්න.**

6) රාහුල කුමරුගේ මව.............................................................................වේ.

7) දියුණුවේ දොරටු............................................. තම පියා විසින් පුතාට පෙන්වා දෙන ලදී.

8 ) සීල, සමාධි, ප්‍රඥා.......................................................නමින් හැඳින් වේ.

9) තමා වරදින් වැළකීම, අන් අය ලවා වැරදි නොකරවීම, අන් අය කරන වැරදි

අනුමත නොකිරීම යන අංග......................................................සීලයට අයත් වේ.

10) මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යනුවෙන් හඳුන්වන්නේ......................................වේ.

**(ත්‍රි ශික්‍ෂාව, ත්‍රිකෝටික පාරිශුද්ධ, සිව්බඹ විහරණ, යශෝධරා දේවිය, හයක්)**

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල *"අ"* කොටසට අදාළ නිවැරදි පිළිතුර *"ආ"* කොටසෙන් තෝරා එහි අංකය වරහන තුළ ලියන්න.**

| *"අ" කොටස* | | *"ආ" කොටස* |
|---|---|---|
| **11)** වැව් පොකුණු සෑදීම් ආදී පොදු කටයුතු කළේ, | (.........) | 1 බුදුරජාණන් වහන්සේ. |
| 12) ශ්‍රී ලාංකීය ජාතියේ සංකේතය | (.........) | 2 මඝ කුමරු ඇතුළු පිරිස |
| 13) ආනන්ද සර්පයා දුටුවා ද යනුවෙන් අසන ලද්දේ, | (.........) | 3 අනිත්‍යතාවය යි. |
| 14) ලොව පණ ඇතිදේ හා පණනැති දේ නිතර වෙනස්වන ලක්‍ෂණය, | (.........) | 4 රාහුල කුමරුට ය. |
| 15) කැඩපත උපමාවට පෙන්වා දුන්නේ, | (.........) | 5 ජාතික කොඩිය යි. |

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල අදාළ ප්‍රකාශය හරි නම් හරි ( √ ) ලකුණ ද,**

**වැරදි නම් වැරදි (×) ලකුණ ද වරහන තුළ සටහන් කරන්න.**

16) ආර්යාෂ්ටාංගික මාර්ගය දුක්ඛ නිරෝධගාමිණී පටිපදාර්යය සත්‍යයට අයත් වේ. ( )

17) පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි යනුවෙන් සඳහන් වන්නේ **"මම පණ ඇති සතුන් මැරීමේ සිල්පදය සමාදන්වෙමි"** යන අර්ථයයි. ( )

18) ආහාර පාන සපයාදීම, අවශතා ඉටුකරදීම දරුවන් විසින් ඉටුකරන යුතුකම්වලට අයත් ය. ( )

19) මඝ ඇතුළු පිරිස ඇතා විසින් මරණයට පත් නොකළේ ඔවුන් ළඟ මන්ත්‍රයක් තිබූ නිසාවෙනි. ( )

20) ජාතික ගීයේ නිර්මාත්‍යවරයා ආනන්ද සමරකෝන් මහතා ය. ( )



LIVEWORKSHEETS